# ඔබ සංචාරක කටයුතු සම්බන්ධයෙන් සේවා සපයන්නේ ද?

2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනත යටතේ වන ඔබගේ නෛතික බැඳීම් පිළිබඳ ඔබ දැනුවත් ද?

එකී පනතේ 48 වන වගන්තිය අනුව ඔබ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී බලපත්‍රයක් ලබාගත යුතු ය.

මෙය පැහැර හරිනු ලබන සෑම සංචාරක ව්‍යවසායකයන් හෝ සේවා සපයන ආයතනයන් හෝ පුද්ගලයන් ඉහත පනතේ 63 වන වගන්තිය යටතේ වරදකරුවන් වන අතර දඩයකට හා සිරදඬුවමකට ලක්කළ හැකිය.

**ලියාපදිංචි කළ යුතු සංචාරක ආයතන හා සේවාවන් වන්නේ,**

හෝටල්, ආගන්තුක නිවාස, සත්කාරක නිවාස ඒකක, සංචාරක බංගලා, සංචාරක කුලී නිවාස ඒකක, පෞරාණික බංගලා, සංචාරක කුලී මහල් නිවාස, මහල් නිවාස හෝටල්, කුඩා සුවපහසු හෝටල් (බුටික් හෝටල්, බුටික් විලා), ආයුර්වේද හෝටල්, පෞරාණික හෝටල්, සංචාරක අවන්හල්, සංචාරක නේවාසිකාගාර,

සහ

සංචාරක නියෝජිත ආයතන, සංචාරක ආයුර්වේද සත්කාරක සේවා මධ්‍යස්ථාන, සංචාරක යාත්‍රා මෙහෙයුම්, ජලාශ්‍රිත සංචාරක ක්‍රියාකාරකම්, තල්මසුන් හා ඩොල්ෆින් නැරඹීම, සංචාරකයින් සඳහා වන ස්පා (සම්බාහන ආයතන) සහ ශරීර සුවතා මධ්‍යස්ථාන, වාහන සෆාරි චාරිකා මෙහෙයුම්කරුවන්, ත්‍රාසජනක සංචාරක ක්‍රියාකාරකම් (ගොඩබිම, ජලය සහ අහස), කඳවුරු බැඳීම, ඇතුන් පිට සෆාරි චාරිකා මෙහෙයුම්කරුවන්, කුළුබඩු උද්‍යාන හා විකුණුම් මධ්‍යස්ථාන, සංචාරක මාර්ගෝපදේශන සේවා සහ අනෙකුත් සංචාරක සේවාවන්.

සියලුම සංචාරක සේවාවන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි කිරීම ඔබගේ වගකීම බව මෙයින් දැනුම් දෙමු.

ඒ සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ

Web : www.sltda.gov.lk හෝ E-mail : info@srilanka.travel අන්තර්ජාලය හරහා

නැතහොත්

Hotline : 1912 Tel : 0112426800 හෝ 0112437059 හෝ 0112437060 (කාර්යාල වේලාවන් තුළ) අමතා ඔබගේ

**සංචාරක සේවාව ලියාපදිංචි කිරීම පිළිබඳ තොරතුරු ලබා ගන්න.**

**රටේ දියුණුවට සංචරණය විධිමත් කරමු.**

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

**සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය**